# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ලංකාවේ රෝමානු කතෝලික අග්‍රරාජගුරු ප්‍රසාදීන් වහන්සේ සහ රාජගුරු ප්‍රසාදීන් වහන්සේලා (සංශෝධන)

**ලංකාවේ රෝමානු කතෝලික අග්‍රරාජගුරු ප්‍රසාදීන් වහන්සේ සහ රාජගුරු ප්‍රසාදීන් වහන්සේලා පිළිබඳ ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නෙරංජන් වික්‍රමසිංහ මහතා විසින්
2013 අප්‍රේල් මස 24 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2013 අප්‍රේල් මස 16 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[236 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 6.00 යි** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

2—PL 007180—750 (2013/04)

# ලංකාවේ රෝමානු කතෝලික අග්‍රරාජගුරු ප්‍රසාදීන් වහන්සේ සහ රාජගුරු ප්‍රසාදීන් වහන්සේලා (සංශෝධන)

**ලංකාවේ රෝමානු කතෝලික අග්‍රරාජගුරු ප්‍රසාදීන් වහන්සේ සහ රාජගුරු ප්‍රසාදීන් වහන්සේලා පිළිබඳ ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

පූර්විකාව.

මෙතෙක් කල් ත්‍රිකුණාමලය රෝමානු කතෝලික රාජගුරු ප්‍රසාදීන් වහන්සේගේ ආගමික බල ප්‍රදේශය යටතේ පැවති ප්‍රදේශයෙන් කොටසක මඩකලපුව රෝමානු කතෝලික රදගුරු වසම නමින් නව රදගුරු වසමක් බවට පත්කොට එය පරිපාලනය කිරීම සඳහා අති උතුම් දේවධර්මාචාර්ය ජෝසප් පොන්නයියා රාජගුරු ප්‍රසාදීන් වහන්සේ මඩකලපුව රෝමානු කතෝලික රාජගුරු ප්‍රසාදීන් වහන්සේ වශයෙන් යථා පරිදි පත් කරනු ලැබ ඇති හෙයින් ද ;

මඩකලපුව රෝමානු කතෝලික රාජගුරු ප්‍රසාදීන් වහන්සේ සංස්ථාගත කිරීමට විධිවිධාන සලස්වන පරිදි සහ වෙනත් කරුණු සම්බන්ධයෙන් ද ලංකාවේ රෝමානු කතෝලික අග්‍රරාජගුරු ප්‍රසාදීන් වහන්සේ සහ රාජගුරු ප්‍රසාදීන් වහන්සේලා පිළිබඳ ආඥාපනත සංශෝධනය කිරීම අවස්ථානුකූල වන හෙයින් ද ;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2013 අංක ..... දරන ලංකාවේ රෝමානු කතෝලික අග්‍රරාජගුරු ප්‍රසාදීන් වහන්සේ සහ රාජගුරු ප්‍රසාදීන් වහන්සේලා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

338 අධිකාරයට 3ඉ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**2.** 2000 අංක 19 දරන පනතින් අවසන් වරට සංශෝධනය කරන ලද පරිදි වූ ( මෙහි මින්මතු ප්‍රධාන ප්‍රඥප්තිය යනුවෙන් සඳහන් කරනු ලබන) ලංකාවේ රෝමානු කතෝලික අග්‍රරාජගුරු ප්‍රසාදීන් වහන්සේ සහ රාජගුරු ප්‍රසාදීන් වහන්සේලා පිළිබඳ ආඥාපනතේ 3ඈ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කිරීමෙන් එම පනත තවදුරටත් සංශෝධනය කරනු ලබන අතර ඒ වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 3ඉ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය :—

2—PL 007138—75 (2013/04)

“මඩකලපුව රෝමානු කතෝලික රාජගුරු ප්‍රසාදීන් වහන්සේ සංස්ථාගත කිරීම.

3ඉ. මඩකලපුව රාජගුරු ප්‍රසාදීන් වහන්සේ, එනම් අති උතුම් දේවධර්මාචාර්ය ජෝසප් පොන්නයියා රාජගුරු ප්‍රසදීන්වහන්සේ සහ රෝමානු කතෝලික සභාවේ නීති හා ව්‍යවහාරයන් අනුව යථා පරිදි පත් කරනු ලබන උන්වහන්සේගේ අනුප්‍රාප්තිකයන් ද සංස්ථාවක් වන අතර, ඒ සංස්ථාව මේ ආඥාපනතේ සියලු කාර්ය සඳහා “මඩකලපුව රෝමානු කතෝලික රාජගුරු ප්‍රසාදීන් වහන්සේ” නමින් හැඳින්වෙන්නේ ය. තව ද එම නාමය යටතේ අවිච්ඡින්න පැවැත්මක් එයට ඇති අතර, සෑම විස්තරයකම චංචල හා නිශ්චල දේපල අත්කර ගැනීමේ, මිලට ගැනීමේ, ලබා ගැනීමේ, දරා සිටීමේ හා භුක්ති විඳීමේ ද එකී දේපල විකිණීමේ හෝ ඒ පිළිබඳව අන් ආකාරයකින් සුදුස්සක් කිරීමේ ද පූර්ණ බලය ඒ සංස්ථාවට ඇත්තේ ය. ඒ දේපල සම්බන්ධයෙන් ඒ නාමයෙන් ඒ සංස්ථාව විසින් ද සංස්ථාවට විරුද්ධව ද සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකි ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 5ඉ වගන්තිය ඇතුළත් කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 5ඈ වැනි වගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් වගන්තිය ඇතුළත් කෙරෙන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියෙහි 5ඉ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය. :—

“මඩකලපුව රෝමානු කතෝලික රාජගුරු ප්‍රසාදීන් වහන්සේ වෙත දේපල සතුකර දීම.

5ඉ. එකී අති උතුම් දේවධර්මාචාර්ය ජෝසප් පොන්නයියා රාජගුරු ප්‍රසාදීන් වහන්සේ විසින් උන්වහන්සේගේ නිල තත්ත්වයෙන් දැනට අත්කර ගෙන ඇති, දරනු ලබන හෝ සන්තකයේ තබා ගෙන සිටින චංචල හා නිශ්චල යන දෙවර්ගයේම සියලු දේපල ඒවා කෙරෙහි බලපාන යම් භාරයකට හෝ කොන්දේසියකට හෝ යටත් ව එකී මඩකලපුව රෝමානු කතෝලික රාජගුරු ප්‍රසාදීන් වහන්සේ වෙත සතු වන්නේ ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4.** 2000 අංක 19 දරන පනතින් අවසන් වරට සංශෝධනය කරන ලද පරිදි වූ ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වැනි වගන්තියේ (5) වැනි උප වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

> “(6) මඩකලපුව රෝමානු කතෝලික රදගුරු වසම ඇති කිරීමේ හේතුවෙන් මඩකලපුව රෝමානු කතෝලික රාජගුරු ප්‍රසාදීන් වහන්සේගේ පරිපාලනයට යටත් වන්නා වූ සියලු චංචල හා නිශ්චල දේපල සම්බන්ධයෙන් මඩකලපුව රෝමානු කතෝලික රාජගුරු ප්‍රසාදීන් වහන්සේ නමට ත්‍රිකුණාමලය රාජගුරු ප්‍රසාදීන් වහන්සේ විසින් ලියා අත්සන් කරන ලද යම් හිමිකරදීමේ හෝ පැවරීමේ කවර සාධන පත්‍රයකට වුව ද 1982 අංක 43 දරන මුද්දර ගාස්තු පනතේ 2 වැනි වගන්තිය යටතේ යම් සාධන පත්‍රයක් සඳහා අය කරනු ලබන නියමිත මුද්දර ගාස්තු අය කරනු ලැබිය යුතු ය.”.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**5.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.